**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය.-2013**
**-------------------------------------**

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය විසින් පවරාගත් ඉඩම් කොටසක් වෙනුවෙන් රු.21,703,500 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ලබා දී තිබුණි. වත්කම් ඉවත් කිරීමෙන් වූ ප්‍රතිඵලය හඳුනාගැනීම සඳහා අවශ්‍ය ගැලපීම් කර නොතිබූ අතර ලද මනාව පොදු තැන්පත් ගිණුමට මාරු කිරීම නිසා ඉවත් කරන ලද ඉඩම් කොටස තවදුරටත් ආයතනයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ආයතනයේ නිලධාරීන් විසින් ඔවුන් වෙනුවෙන් විශ්වාස භාර රක්ෂණ ඇප මුදලක් ලෙස රු.78,876 ක් ආයතනය නමින් විවෘතකර තිබූ ඉතිරිකිරීමේ තැන්පත් ගිණුමක තැන්පත් කර ඇති බව අනාවරනය වුවද මෙම ගණුදෙනුව සම්පූර්ණයෙන්ම ගිණුම් වලින් අත්හැරී තිබුණි. මෙයට අතිරේකව මූල්‍ය තත්ව ප්‍රකාශනය අනුව විස්වාස භාර ඇප තැන්පත් ලෙස රු.10,966 ක් පෙන්නුම් කර ඇතත් එයට අදාල වත්කමක් නිරූපනය නොකෙරුණි.

(ආ) ගණනය කිරිමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරිම් රු. 152,951 ක මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.100,000 ක උපදේශක ගාස්තු අතීතානුයෝගීව හෝ සුදුසු පරිදි ගැලපීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී මෙම මුදලින් රු. 50,000 ක් ගෙවා ඇතත් එය උපචිත වියදම් ගිණුමට හර කිරීම නිසා වර්ෂය අවසානයට වූ ගෙවිය යුතු වියදම් රු. 50,000 කින් අඩුවෙන් දක්වා තිබුණි

(ඈ) ලැබිය යුතු ආයෝජන පොළී ආදායම රු.65,169 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාඛා කාර්යාලවල සේවයේ නියුතු නිලධාරින්ගේ ආපදා ණය ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අගයන් අතර වූ රු.799,561 ක වෙනස නිරවුල් කර නොතිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ශාඛාවන් වලට හා ප්‍රධාන කාර්යාලයට අදාල ගෙවීම් ප්‍රධාන කාර්යාලයෙස් සිදු කරන අතර මේ සම්බන්ධ අන්තර් ගණුදෙනු එකිනෙකට හිලව් නොකර ශාඛාවන්ගෙන් ලැබිය යුතු ශාඛාවන් විසින් ගෙවිය යුතු ප්‍රමාණයන් වත්කම් හා වගකීම් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද මෙම ගිණුම් නියමිත පරිදි සැසඳුම් කර තුලනය කර නොගැනීම හේතුවෙන් ගිණුම් දෙක අතර රු. 702,695 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත වෛද්‍ය සේවා සැපයීම වෙනුවෙන් ලැබියයුතු එකතුව රු. 3,116,976 ක මුදලක් පැවති අතර එය විගණිත දිනය වූ 2014 මැයි 30 දින වන විටත් අයකර නොතිබුණි.

(ආ) නුගේගොඩ ආයතන පරිශ්‍රයේ පවත්වාගෙන ගිය මෙට්‍රෝපොලිටන් බස් සමාගම 2012 දෙසැම්බර් මාසයේ දී ඉවත්කරගෙන තිබූ අතර එම සමාගමට ආයතනයෙන් සපයන ලද ආරක්ෂක සේවාව වෙනුවෙන් අයවිය යුතු ගාස්තුව වූ රු.742,312 ක මුදලක් අයකර නොතිබුණි.

(ඇ) නුගේගොඩ ආයතන පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් රියදුරු අභ්‍යාස විද්‍යාලයෙන් අයවිය යුතු වර්ෂ දෙකක බදුකුලිය රු 120,000 ක මුදල අයකර නොතිබුණු අතර බදු ගිවිසුමේ කාලය 2011 වර්ෂයේදී අවසන්වී තිබුණද එම බදු ගිවිසුම අළුත් කිරීමටද කටයුතු කර නොතිබුණි. තවද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් සපයන ලද ආරක්ෂක සේවාව වෙනුවෙන් ගාස්තු ගෙවීම් කිරීමේදී මුළු සේවා ගාස්තුවෙන් 1/5 ක මුදලක් රියදුරු අභ්‍යාස විද්‍යාලය සඳහා ආරක්ෂාව සැපයීම වෙනුවෙන් අඩුකර ගෙවීමට එකඟවී තිබුණද එසේ නොකර සම්පූර්ණ මුදලම ගෙවා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.1,726,180 ක මුදලක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ආපසු අයවීමට තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ආයතනය වෙත ලැබිය යුතු රු.10,484,219 ක මුදල ආයතනය විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ගෙවිය යුතු රු.2,549,767 ක මුදල හා හිලව් කර ගිණුම් වලින් ඉවත් කිරීමට 2011 ජූලි මස 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද මේ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ එකඟත්වය ලැබී නොතිබුණි.

(ඉ) කුරුණෑගල හා ගාල්ල ශාඛාවන් තම ගොඩනැගිලි කුලී ගිවිසුම් වල කාලය අවසන් වීමට පෙර ඉවත්කර ගැනීම නිසා රු.135,500 ක් වූ ආරක්ෂක ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු.24,080,000 ක සහ රු.254,910,018 ක මුදලක් ආයෝජනය කර තිබුණත් ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වන පරිච්ඡේදය 1.3 වගන්තිය | රාජකාරියේ යොදවනු ලැබූ නිලධාරීන් සඳහා සංයුක්ත දීමනාවට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී නවාතැන් සඳහා රු.142,062 ක් සහ ආහාර පාන සඳහා රු. 46,180 ක මුදලක් ආයතනය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 102 | වාර්ෂික වරිපනම් බදු මුදල ජනවාරි 31 දිනට ගෙවීමේදී සියයට 10 ක වට්ටම් මුදලක් ලබාදෙන බව තක්සේරු දැන්වීම්වල දක්වා තිබියදීත් නියමිත දිනට පෙර මුදල් ගෙවා රු.49,153 ක වට්ටම් වාසිය ලබාගෙන නොතිබූ අතර ප්‍රමාද කර මුදල් ගෙවීම නිසා රු 50,192 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි. 757(2)(ආ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු අවසන් කර නොතිබූ බැවින් එහි පිටපතක් නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට හැකිවී නොතිබුණි. |
| (ඈ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 7/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුට අනුමැතියකින් තොරව මසකට එක් දිනකට වඩා රාජකාරියේ යෙදීම වෙනුවෙන් 1/20 දීමනා ලෙස රු. 43,828 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එම නිලධාරිනිය ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාකාරීව තිබියදීත් එම දිනවලදී පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් නොකිරීම නිසා පැය 08 කට නොඅඩු කාලයක් සේවයේ යෙදී සිටි බවට තහවුරු නොවුණි. |
| (ඉ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 31/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය යුතු උපරිම උත්සව අත්තිකාරම් මුදල රු.5,000 ක් වුවද රු.25,000 බැගින් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,960,000 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඊ) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 27/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය යුතු උපරිම විශේෂ අත්තිකාරම් මුදල රු.2,500 ක් වුවද, රු.25,000 බැගින් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 4,445,000 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. තවද මෙම මුදල සඳහා පොළී අයකර නොතිබූ අතර, මේ නිසා අහිමි වූ ආදායම රු. 396,600 ක් විය. |
| (උ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 (සී) වගන්තිය හා 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ප්‍රසාද දීමනා හා දිරි දීමනා යන දෙකෙන් එකක් පමණක් ගෙවීම් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස රු. 2,346,025 ක් හා දිරි දීමනා ලෙස රු. 1,809,625 ක් ගෙවා තිබුණි. මෙම දිරි දීමනා සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ඌ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ගණකාධිකාරී විසින් ශාඛාවල රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව මාසිකව රු.3000 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 36,000 ක මුදලක් ලබාගෙන තිබුණි. |
| (එ) 2008 ජූලි 28 දිනැති පීඊඩී/50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3 ඡේදය හා 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නොමැති III වන පන්තියේ ගණකාධිකාරිවරයකුට මාසිකව රු.12,500 බැගින් රු.150,000 ක ඉන්ධන දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඒ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක අයිඒඅයි/2002 /2 දරන චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ අතිරික්තය රු.111,201,907 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 13,979,214 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.125,181,121ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. රියදුරු බලපත්‍රයක් ලබාගැනීමේදී ලබාගත යුතු වෛද්‍ය සහතිකය මෙම ආයතනයෙන් පමණක් ලබාගැනීමට ප්‍රවාහන අමාත්‍යාංශය විසින් තීරණය කිරීම නිසා වෛද්‍ය සේවා ආදායම සියයට 126 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ආයතනය විසින් සකස්කර තිබූ ප්‍රගති වාර්තා අනුව ප්‍රගතිය මැනීම සඳහා මූල්‍ය කාර්ය සාධනය සැලකිල්ලට ගෙන තිබූ අතර එම වාර්තාවට අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 20 ට වඩා අඩු පරාසයක ඇති අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම හේතුවෙන් කාර්ය මණ්ඩල සඳහා පුහුණුව ලබා දිය යුත්තේ කුමන ක්ෂේත්‍රයක කවුරුන් සඳහා, කොපමණ කාලයකටද යන්න නිරීක්ෂණය නොවුණු අතර, ගිණුම් හා පාලන ක්ෂේත්‍රයන් ඇතුළු විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීමට පුද්ගලයින් 24 දෙනෙක් සඳහා රු. 301,000 ක් වියදම් කර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මහනුවර ශාඛා කාර්යාලය ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී හෙක්ටයාර් 0.0472 ක රජයේ ඉඩම් කොටසක් ලැබී තිබුණද එහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා මාසිකව රු. 55,000 බැගින් කුලී ගෙවමින් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම නිසා සමාලෝචිත වර්ෂ සඳහා රු.660,000 ක මුදලක් කුලී වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) රත්නපුර ශාඛාව ඉදිකිරීම සඳහා ඉඩමක් ලබාගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පෙරසැරි ගාස්තු වශයෙන් රු.100,000 ක මුදලක් ගෙවා තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය ලබාදුන් බදු දේපල ප්‍රමාණවත් නොවන නිසා එය ප්‍රතික්ෂේප කර තිබූ අතර මෙම මුදල ආපසු අයකරගැනීමට හෝ කපාහැරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) අනුරාධපුර ශාඛාව සඳහා ආරක්ෂක වැට ඉදිකිරීමට හා තීන්ත ආලේප කිරීමට ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම සඳහා රු. 10,000 ක මුදලක් 2012 පෙබරවාරි මාසයේදී ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඈ) ආයතනයට අයත් මෝටර් රථයක් අනතුරකට භාජනය වීම නිසා එය අළුත්වැඩියා කිරීම සඳහා රු. 55,229 ක මුදලක් වැයවී තිබුණි. මේ සඳහා රු.42,114 ක මුදලක් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබූ අතර රක්ෂණයෙන් ආවරණය නොවූ රු. 13,115. ක මුදල වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර නොගෙන අළුත්වැඩියා වියදම් යටතේ ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ඉ) ආයතනයේ වේරහැර ශාඛා ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම සඳහා රු. 5,058,577 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණද ආයතනය වෙත ඉඩම පවරා ගෙන නොතිබුණි.

(ඊ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර එක් එක් වත්කමේ වටිනාකම්ද සටහන් කර නොතිබුණි.

(උ) හිටපු සභාපතිවරයා භාවිතා කල ජංගම දුරකථනය නැවත ආයතනයට භාර දී නොතිබුණු අතර ඔහු අතින් නැතිවූ වෙනත් දුරකථනයක් සම්බන්ධයෙන්ද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) කළුතර දිස්ත්‍රික්කයේ නීතිඥ සංගමයක් විසින් කළුතර මහ රෝහලට අත්‍යාවශ්‍ය උපකරණ ලබාදීමේ වැඩසටහනක් සඳහා මූල්‍ය අනුග්‍රහයක් දක්වන ලෙස සභාපතිවරයා ගෙන් ඉල්ලා තිබූ අතර රෝහල් අධ්‍යක්ෂකවරයා විසින් ඉල්ලා ඇති උපකරණ ලැයිස්තුවක්ද එවා තිබුණි. එහෙත් එම උපකරණ ලැයිස්තුවේ සඳහන්ව නොමැති රෙදි සෝදන යන්ත්‍රයක් රු.33,210 කට මිලදී ගෙන නීතිඥ සංගමය වෙත ලබාදී තිබූ අතර මෙම රෙදි සෝදන යන්ත්‍රය නීතිඥ සංගමය විසින් භාරගත් බවට හෝ කළුතර මහ රෝහල විසින් භාරගත් බවට තහවුරු වන කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(එ) ආයතනයට අවශ්‍ය බෙහෙත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කර ඇති නමුත් හදිසි අවශ්‍යතාවයන් සඳහා බෙහෙත් ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා රු. 40,000 ක අග්‍රිමයක් නිලධාරියකු වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) ලියාපදිංචි සැපයුම් කරුවන් සිටියදී නිරන්තරවමවිධිමත් අනුමැතියකින් තොරව හදිසි අවශ්‍යතාවයන් ලෙස සලකා මෙම අග්‍රිමය තුලින් මිලදී ගැනීම් සිදු කිරීම.

(ii) විධිමත් මිලදීගැනීම් ක්‍රමයක් තුලින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තබාගැනීමේ ක්‍රමයක් හඳුන්වා නොතිබීම.

(iii) මුදල් ගෙවීම සඳහා පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම හා චෙක්පත් මගින් ගෙවීමේ හැකියාව පිලිබඳ අවධානය යොමු නොකිරීම.

## 4.2 සේවක මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සඳහා අනුමත කළ කාර්ය මණ්ඩලය සහ සමාලෝචිත වර්ෂය දිනට වූ තත්‍ය කාර්ය මණ්ඩලය සමග සැසඳීමේදි නිලධාරින් 127 ක අතිරික්තයක් සහ නිලධාරින් 30 ක ඌනතාවයක් පැවතුණි.

(ආ) 2008 වර්ෂයේදි අනුමත කළ කාර්ය මණ්ඩලය සඳහා වූ ආයතනයේ සංවිධාන සටහන 2012 නොවැම්බර් 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඈ) ඡේදය ප්‍රකාරව සංවිධාන සටහන සහ අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) ආයතනයට අදාළ බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණද යම් සේවකයකු බඳවා ගැනීමේදී එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම්වත් සම්පූර්ණ කර තිබියයුතු වුවත් එසේ අවම සුදුසුකම්වත් සම්පූර්ණ කර නොමැති පුද්ගලයකු කළමනාකරණ සහකාරවරයකු වශයෙන් (ලිපිකරුවකු) බඳවාගෙන තිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ පරිපාලන උපදේශක තනතුරක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු. 299,700 ක දීමනාවක් ගෙවා තිබුණි.

4.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

අංක පීඊඞී/12 දරන හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.9 ඡේදයට පටහැනිව ආයතනයේ රියදුරෙකු ප්‍රවාහන අමාත්‍යවරයාගේ සම්බණ්ධීකරණ ලේකම් ගේ රියදුරු වශයෙන් 2012 ජූනි 12 දින සිට පත් කර තිබුණි. මේ සඳහා 2012 ජූනි සිට 2013 නොවැම්බර් දක්වා වැටුප් හා අතිකාල වශයෙන් රු. 531,287 ක් හා ගමන් වියදම් වශයෙන් රු. 45,585 ක් ආයතනය විසින් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 හා 5.1.3 ඡේද ප්‍රකාරව වර්ෂය සඳහා සැළසුම් කරන ලද කාලයතුළ අරමුණු හා ඉලක්ක ලඟා කරගැනීමට හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාර 2013 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන හා තථ්‍ය ශේෂයන් සංසන්දනය කිරීමේ දී සියයට 14 සිට සියයට 465ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 හා 2012 වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා 2014 ජූලි මාසය අවසන් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධ අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) සේවක ණය
(ඇ) ණයගැතියෝ
(ඈ) තොග පාලනය
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඊ) අයවැය පාලනය